# තැනට ඔබින ඇඳුම කුමක්ද?



දරුවෙකු මව්කුස පිළිසිඳගත් මෙහොතේ සිට මෙලොව එළිය දකින තුරු අන්ධකාරයේ සහ නිරුවතින් සිටින බව අපි දනිමු. එබැවින් උපත ලබන්නේ නිරුවතින් බවද දනිමු. එහෙත් උපන් වේලාවේ සිට මරණය දක්වා ජීවිතයේ විවිධ අවස්ථාවන්ට උචිත ඇඳුම් ඇඳීම පිළිගත් සම්ප්‍රදායකි. පිරිමින් කෙසේ වෙතත් කාන්තා පක්ෂය තමන් අඳින ඇඳුම ගැන විශේෂයෙන් සැලකිලිමත් වීමත් ඇඳුමෙන් සැරසී එළියට බැසීමට සෑහෙන වේලාවක් ගතකරන බවත් ගැහැණු පිරිමි දෙපක්ෂයම හොඳාකාරව දනිති. එහි ඇති වරදක් නැත. එය කාන්තා ස්වභාවය මෙන්ම හොඳ පුරුද්දකි. එහෙත් වරද ඇත්තේ ගැහැණු පිරිමි බොහෝ දෙනෙකුට තැනට ඔබින ඇඳුම තෝරා ගැන්මට ඇති වැටහීම මඳකමයි. ශීත ඍතුවට අඳින ඇඳුම වසන්තයට නොගැලපේ. වසන්තයට අඳින ඇඳුම ගිම්හානයට සුදුසු නොවේ. එමෙන්ම වසන්ත කාලයට අඳින ඇඳුම ශීත කාලයට ඔරොත්තු නොදේ. ඈත අතීතයේ සිට ඇඳුම් සකස්වී ඇත්තේ ඒ ඒ දේශයන්ට සරිලන පරිද්දෙනි. මේ කිසිවක් නොසලකන මුස්ලිම් රටවල ඇඳුම සකස් වී ඇත්තේ තනිකරම ආගමික සදාචාරය අනුව බව පෙනේ. ඇඳුම් තෝරා ගැනීමේදී ඇඳුමේ පැහැය, සමේ පැහැය, ඇඳුම් විලාසිතාව විශේෂ තැනක් ගනී.

සහභාගිවන උත්සවයට හෝ කටයුත්තට සුදුසු ඇඳුම තෝරා ගැනීම ඉතා ප්‍රවේශමෙන් කළ යුතු දෙයකි. මරණ යකදී අපට දක්නට ලැබෙන්නේ සුදු හෝ කලු ඇඳුමෙන් සැරසුණු පිරිස මිස රතුපාටින් සැරසුණු මැයි පෙළපාලිකරුවන් වැනි පිරිසක් නොවේ. විවාහ මංගල්‍ය යකදී සුදු ඇඳුමෙන් සැරසුණු මනමාලිය හැරුණු විට නානා වර්ණයෙන් සැරසුණු නෑදෑ හිතවතුන් දක්නට ලැබෙන සුලභ දර්ශණයකි. මංගලෝත්සව වල ඇඳුම් පැළඳුම් ඒ විදියට ය.

ආගමික උත්සවයන් ගත් කල ක්‍රිස්තියානි, මුස්ලිම්, බෞද්ධ, යුදෙව්, කොදෙව් ආදී සියළු බැතිමතුන් පිරිසිදු ඉතා චාම් සහ සරල ඇඳුමෙන් සැරසීම පිළිගත් සිරිතකි. එම සිරිත තහංචි පැනවීමකින් ඇතිවූ දෙයක් නොවේ. හුදෙක් එය ආග මික ස්ථානවල දක්නට ලැබෙන සන්සුන් ස්වභාවය හා පිවිතුරුබව නිසා ඉබේම ඇතිවූ විනීත ගුණයක ලක්ෂණයක් විය හැකිය. කුඩා කල සිටම බෞද්ධ අපව හුරු කළේ පන්සල් යනවිට දහම් පාසැල් යන විට සුදු ඇඳුමෙන් සැරසී යාමටයි. අප තුළ ඒ පුරුද්ද අදටත් හෙටටත් මතුව ටත් ඒ පරිද්දෙන්ම පවතිනවා ඇත. ලංකා ඉරිදා දහම් පාසැල්වල දරු දැර-යන් ගුරු වරුන් සුදු ඇඳුමෙන් සැරසී සිටින දර්ශ ණය දෙනෙතට කොතරම් සුවදායකද?

අප දැනට ජීවත්වන එංගලන්තයේ බෞද්ධ විහාරස්ථානවල එවන් වතාවත් හා පිළිවෙත් මුල දී අකුරට පිළපැද්ද නමුත් දැන් දැන් ඒ සියල්ල නුහුරට හැරෙමින් පවතිනවා දක්නට ලැබීම අපගේ අවාසනාවකි. එමෙන්ම එය අපගේ ආගමික සහ සංස්කෘතික පරිහානිය ආරම්භවීමට හේතුවෙනවා නියතය.

බම්බලපිටියේ හින්දු කෝවිලේ වේල් උත්සවය ඔබට මතක නම් එය එක් අතකින් ආගමික උත්සවයක් වන අතර, තවත් අතකින් සැණකෙළියක ස්වරූපය ගනී. එක්සත් රාජධානියේ ඇතැම් බෞද්ධ විහාරස්ථානයන් කරා ඇදෙන බැතිමතුන් වෙසක් පොසොන් වැනි උතුම් දිනවල විහාරස්ථාන කරා ඇදෙන්නේ වේල් බලන්න යනවා වගේය. සමහර උදවියගේ වෛවර්ණවත් ඇඳුම් පැළඳුම් සිහිගන්වන්නේ වේල් කරත්තයයි. කර විසාලකර කැපූ මෙන්ම, ප්‍රමාණයටත් වඩා කොට ඇඳුමෙන් සැරසී සිටින කාන්තාව නොසිතන විධියට අඟපසඟ නිරුවත් කර පෙන්වයි. දොහොත් තබා වන්දනා මාන කරන විට ඉදිරියට දණ නමා බුදු රුව ඉදිරියේ නැඹුරු වන අවස්ථා වල පිටුපස සිටින අනෙකුත් බැති මතුන්ගේ සමාධි දැහැන කඩා වැටෙනවා නො-වේදැයි සිතෙයි.

ඇතැම් සිංහළ තරුණයින් පන්සලට එන්නේ ව්‍යායාම කරන් නට හෝ දුවන්නට අඳින ට්‍රැක් සූට් ඇඳගෙනය. මයිකල් ජැක්සන්ගේ හෝ බෲස් ලී ගේ පින්තූරය මුද්‍රණය කළ ටී ෂර්ට් ඇඳගනය. මේ සියල්ල දකින විට සිතෙන්නේ මේ සිංහල පිරිස් කොහේ සිට එංගලන්තයට ආවාද කියාය. සැබැවින්ම මේ නම් බෞද්ධකම, හැදියාව නොවේ. මෙය ආගම දහමට නින්දා කිරීමකි.

පන්සලක, පල්ලියක, කෝවි ලක හෝ වෙනත් ආගමික ස්ථාන යක කෙසේ හැසිරිය යුතුද, කෙසේ ඇඳ පැළඳ සිටිය යුතුද යන්න ආගමික හා සංස්කෘතික පසුබිම මත තීරණය වන්නක් මිස උසාවියකින් නියම කළ නීති පද්ධතියක් නොවේ.

වයස මුහුකුරා යාමත් සමග ජීවිතයේ චාම් බව සහ සංවරකම වර්ධනය විය යුතුය. විටින් විට සිතේ මතුවන තරුණ හැඟීම්වලට හා නවීන විලා-සිතාවන්ට අවනත වී තැනට වයසට නොහොබිනා ඇඳුමෙන් සැරසීමෙන්වන්නේ ඔවුන් ශීලාචාර සමාජයේ පිළිකුලට, නින් දාවට අවඥාවට භාජනය වීමයි.

කිසිම පූජණීය ස්ථානයක් රඟමඩලක ස්වරූපය ගන්නේ නැත. කාලයත් සමග ජීවන රටාවත්, ඇඳුම් විලාසිතාත් වෙනස් වුවද වන්දනා මාන කරන, ගෞරව කරන තැනක ඇති ශාන්ත ස්වරූපය කිළුටු කිරීම, වෙනස් කිරීම නොකළ යුතු දෙයකි. කළ යුත්තේ තැනට ඔබින පරිදි පුද්ගල චර්යාව හෙවත් හැසිරීම වෙනස් කරගැන්මයි සංවරකම යනු කුමක්දැයි අවබෝධ කර ගැන්මයි. එසේ නොහැකි අය පන්සල් නොගොස් සිටීම වඩා හොඳය.

ශ්‍රීලංකාවේ මහනුවර දළදා මාළිගාවට හා අනුරාධපුරයේ ශ්‍රීමහා බෝධියට වන්දනාමාන පිණිස එන දෙස් විදෙස් සැදැහැවතුන් සැමට මනාව අඟපසඟ වැසෙනසේ සකස්ව ඇතුල් වියයුතුයයි දැන්වීමක් ප්‍රදර්ශණ ය කර ඇති අතර, එය ක්‍රියාවට නංවන්නට නිලධාරීහුද සිටිති. ඒ ආකාරයෙන් එක්සත් රාජධානියේ විහාරස්ථානවලට එන බැතිමතුන්ටද, විශේෂයෙන් ලාංකික සිංහළ අයට මනා ඇඳුමෙන් සැරසී පමණක් විහාරයට එන ලෙසටත්, විහාරය තුළදී කෑකෝ ගැසීමෙන් තොරව සංවරව හැසිරෙන ලෙසටත් විධානය කිරීමට එකී විහාරස්ථානවල භික්ෂූන් වහන්සේලා කටයුතු කරනවා ඇතැයි ශාසනාලයෙන් යුතුව සිතන්නෙමි.

♦ විල්ෆ්‍රඩ් පෙරේරා
Berkshire UK




මුරලිදරන් 800 වෙනි ටෙස්ට් විකට්ටුව ගත් අවස්ථාවේ දි ඉමහත් ප්‍රීතියෙන් ඔහු ඔසවා ගත් ශ්‍රීලංකා පිළේ සගයෝ

# අපේ යුගයේ ක්‍රිකට් වීරයා-මුරලි

## Leading wicket-takers in the history of Test Cricket

**Muttiah Muralitharan** (Sri Lanka), **800** wickets from 133 Tests
**Shane Warne** (Australia), **708** wickets from145 Tests
**Anil Kumble** (India), **619** wickets from 132 Tests
**Glenn McGrath** (Australia), **563** wickets from 124 Tests
**Courtney Walsh** (West Indies) **519** wickets from 132 Tests
**Kapil Dev** (India), **434** wickets from 131 Tests
**Richard Hadlee** (New Zealand), **431** wickets from 86 Tests
**Shaun Pollock** (South Africa), **421** wickets from 108 Tests
**Wasim Akram** (Pakistan), **414** wickets from 104 Tests
**Curtly Ambrose** (West Indies), **405** wickets from 98 Tests

එය සැබැවින්ම ආශ්වර්යයක් මිස එසේ මෙසේ ජයග්‍රහණයක් නොවේ. අපේ දේශයේ ක්‍රිකට් ක්‍රීඩාවට අලංකාරය, අභිමානය සහ අනභි බවනීයත්වයත් එක්කරමින් මුරලි දරන් නම් අපේ දඟ පන්දු යවන්නා ලෝක වාර්තාවක් තැබීය. ඒ ටෙස්ට් ක්‍රිකට් ඉතිහාසයේ වැඩිම විකට් සංඛ්‍යාවක් ගත් ක්‍රීඩකයා ලෙසිනි.

මෙම වාර්තාවේ ඇති තවත් පුදුම දනවන දෙයක් නම් මුරලිගේ ඒ ලෝක වාර්තාව සැබැවින්ම සිදු වූයේ ඔහුගේ අවසාන පන්දු වාරයේ අවසාන බෝලයටය. ගාලු ක්‍රීඩාංග නයේදී ඉන්දීය ක්‍රීඩකයෙකු වූ ප්‍රඥාන් ඕජා දැවී යාමෙන් මුරලිගේ ටෙස්ට් විකට් **800** ක් කරා යෑමේ බලාපොරොත්තුව සඵල වීය.

**38** වියැති මුරලිදරන්ගේ මේ විශිෂ්ට වාර්තා තැබීම නරඹන්නට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ද ගාළු පිටියට පැමිණ සිටියේ ය. ජනපතිවරයා ඔහුට එහිදී විශේෂ සම්මානයක් ද පිරිනැමී ය.

මුරලි මේසා දුරක් ජය වැඹ වෙත ආවේ අනේක දුෂ්කරතා හිරි හැරද, බොහෝ විවේචකයින්ගේ අපහාස හා කටුක වදන් අතරනි. එහෙත් ඔහුගේ අයෝමය අධිශ්ඨා නය අවසන ඒ සියල්ලන්ගේ කට වල් වැසුවේය. දක්ෂතාවෙන් මෙන්ම ප්‍රසන්න සිනහවෙන් යුත් මුරලි ශ්‍රී ලංකාවේ මෙන්ම මුළුමහත් ලොව පුරා සිටින ක්‍රීඩා ලෝලීන්ගේ අසීමිත ආදරයට පාත්‍රව සිටී.

—— කීර්ති

Relax in style...



HolidayAir
A Travel Experience to Remember

The No. 1 Agent to Sri Lanka
Do not book your Air Ticket with any other travel agent until you speak to us!

15% Discount For Holiday Air customers
Do you need a luxury taxi to take you home from Katunayake Airport?



AIRWING TOURS
Situated at the Arrivals Lounge will do the needful.
Call Holiday Air for more details and your special discount voucher.

Best Value Deals - Colombo 2010

SriLankan £405* + Taxes including free stopover in India / Hong Kong / Tokyo / Beijing / Singapore / Bangkok / Kuala Lumpur
OMAN AIR £200* +Taxes
KUWAIT AIRWAYS £235 +Taxes
ETIHAD AIRWAYS £225 +Taxes
QATAR AIRWAYS £260 +Taxes
Emirates £405* +Taxes

The Airfare Experts
Every destination, every airline, every seat.
Guaranteed savings compared to other online retailers.

0208 440 0770
www.holidayair.com

IATA
96 High Street, Barnet, Herts EN5 5SN
Open 6 days - Mon-Fri 9.00am-6.00pm, Sat 9.30am-5.30pm Closed- Sunday & Bank Holidays
MCG